ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය

போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள்அமைச்சு

MINISTRY OF TRANSPORT AND HIGHWAYS

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022.08 05 |

චක්‍රලේඛ අංකය: 01/2022

සභාපති,
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

**විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 1/2022 යටතේ ශ්‍රී ලංගම ඩිපෝ ඉන්ධනහල් මඟින් ඉන්ධන බෙදාහැරීම සඳහා යෝජිත මාර්ගෝපදේශ**

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ අංක 1/2022 හි 07 වන වගන්තිය යටතේ නියම කර ඇති පරිදි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඩිපෝ මඟින් ඉන්ධන බෙදා දීම පොදු මගී ප්‍රවාහන, කාර්යාල ප්‍රවාහන සේවා, පාසල් ළමුන් ප්‍රවාහන සේවා, කර්මාන්ත, කෘෂිකාර්මික, තේ දළු ප්‍රවාහනය ද ඇතුලුව වැවිලි කර්මාන්ත, විදුලිබල හා ජල සම්පාදන නඩත්තු සේවා යන අංශවල රථ වාහන සඳහා ශ්‍රී ලංගම ඩිපෝ වෙත ලබා දෙන ඉන්ධන ප්‍රමාණය අනුව, ඒ ඒ අංශවලට වෙන් කර දිය හැකි ඉන්ධන ප්‍රමාණය පිළිබඳව අදාළ ඩිපෝ අධිකාරීවරයා විසින් දිසාපතිවරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුම්වත් කර, ගනු ලබන තීරණවලට යටත්ව ඉන්ධන බෙදා හැරීම කළ යුතු ය.

02.ශ්‍රී ලංගම ඩිපෝවල පිහිටුවා ඇති ඉන්ධන පිරවුම්හල්වල ධාරිතාවයන් මෙන්ම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ඇණවුම් කළ පසු නිකුත් කරනු ලබන ඉන්ධන ප්‍රමාණයන් ද පදනම් කර ගෙන පහත සඳහන් මාර්ගෝපදේශයන්ට යටත්ව ඉන්ධන නිකුත් කිරීම සැලසුම් කර ගත යුතු ය.

03.එක් එක් ඉන්ධන පිරවුම්හල් සඳහා ඉන්ධන ලබා ගැනීමට පැමිණෙන ඉහත කී සේවා අංශයන් හි වාහන සංඛ්‍යාව පදනම් කර ගෙන නිශ්චිත කාල සීමාවන් තුළ ලබා දිය යුතු ඉන්ධන ප්‍රමාණය නිකුත් කිරීමට ඒ ඒ ඩිපෝ අධිකාරීන් මඟින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ගත යුතු අතර ඉන්ධන ලබා ගැනීමට පැමිණෙන, චක්‍රලේඛ ප්‍රකාර අනුමත කර ඇති ඉල්ලුම්කරුවන්ට අපහසුතාවයකින් තොරව ඉන්ධන ලබා දීමේ වැඩපිළිවෙළක් ද එම ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කළ යුතු ය. එම කාර්යය පහසු කිරීම සඳහා පහත සඳහන් මාර්ගෝපදේශ නිකුත් කරනු ලබන අතර දිසාපතිවරුන්ගේ හා ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම්වරයාගේ අතිරේක උපදෙස් මත හදිසි අත්‍යවශ්‍ය සේවා ආවරණය කර ගැනීමට ද යටත්ව ඉන්ධන බෙදාහැරීමේ වැඩසටහන පවත්වාගෙන යා යුතු ය.

**1) පෞද්ගලික බස් රථ සඳහා ඉන්ධන ලබා දීම.**

**1.1** අන්තර් පළාත් බස් රථ

I. කොළඹ සහ කොළඹ අවට නාගරික ප්‍රදේශ ආශ්‍රිතව ගමන් ආරම්භ කරනු ලබන හා අවසන් කරනු ලබන අන්තර් පළාත් බස් රථ සඳහා කොළඹ පිටකොටුව බැස්ටියන් මාවත පෞද්ගලික බස් රථ නැවතුම්පළේ පිහිටුවා ඇති හෝ කොට්ටාව මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ පිහිටුවා ඇති ඉන්ධන පිරිවුම්හලෙන් ඉන්ධන නිකුත් කිරීම කළ යුතු ය.

II. කොළඹින් බැහැර බස්නාහිර පළාත තුළ සිට පිට පළාත් වලට ගමන් ආරම්භ කරනු ලබන අන්තර් පළාත් බස් රථ සඳහා බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ශ්‍රී ලංගම ඉන්ධන පිරවුම් හල් මගින් ඉන්ධන නිකුත් කිරීම කළ යුතු ය.

III. සෙසු පළාත් වලින් ගමන් ආරම්භ කර වෙනත් පළාතක් දක්වා ධාවනය වන අන්තර් පළාත් බස් රථ සඳහා ද ඒ ඒ පළාත් වල පිහිටි ශ්‍රී ලංගම ඉන්ධන පිරවුම්හල් වලින් ඉන්ධන නිකුත් කිරීම කළ යුතු ය.

IV. පිට පළාත් වලින් ගමන් ආරම්භ කර කොළඹ හෝ මාකුඹුර දක්වා පැමිණෙන අන්තර් පළාත් බස් රථ සඳහා ආපසු ගමනට ඉන්ධන අවශ්‍ය වන අවස්ථාවන්හි දී ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ නිර්දේශ මත මාකුඹුර හෝ බැස්ටියන් මාවත ඉන්ධන පිරවුම්හල් මගින් ඉන්ධන ලබා දිය යුතු ය.

V. කොළඹ බැස්ටියන් මාවත සහ මාකුඹුර ඉන්ධන පිරවුම්හල් සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් සම්බන්ධීකරණ නිලධාරියෙකු පූර්ණ කාලීනව අනුයුක්ත කළ යුතු අතර එම නිලධාරියා ඩිපෝ කළමණාකරු සමඟ සම්බන්ධ වී ඉන්ධන විධිමත්ව සැලසුම් කර ගත යුතුය. මෙම පිරවුම්හල් මගින් ඉන්ධන ලබා දීමේ දී ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් හඳුන්වා දී ඇති පරිගණක යෙදවුම අනිවාර්යයෙන් භාවිතා කළ යුතු ය.

VI. අන්තර් පළාත් බස් රථ සඳහා  කොළඹ බැස්ටියන් මාවත හා මාකුඹුර හැර අනෙකුත් ඉන්ධනහල් මගින් ඉන්ධන ලබා දීමේ දී ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් අදාළ බස් රථය වෙනුවෙන් නිකුත් කළ මාර්ග ධාවන බලපත්‍රය හා ඉන්ධන කූපන් පත්‍රය (ආකෘතිය 01) ඉදිරිපත් කළ යුතු ය.

VII. සෑම බස් රථයක් සඳහාම එක් ගමන් වාරයකට වැය වන ඉන්ධන ප්‍රමාණය ඉන්ධන කූපන් පත්‍රයෙහි සඳහන් කර ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් තහවුරු කළ යුතුය. ඒ අනුව, දිනකට අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය ඉහත සම්බන්ධීකරණ නිලධාරියා හා ඩිපෝ කළමණාකරු මගින් සියලුම මාර්ග ආවරණය වන පරිදි ප්‍රශස්ත ලෙස බෙදා දීමට කටයුතු කළ යුතු ය.

VIII. ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව වෙනුවෙන් පත් කර ඇති පළාත්බද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සම්බන්ධීකරණ නිලධාරියා හා ඩිපෝ කළමණාකරු විසින් අන්තර් පළාත් බස් රථ සඳහා ලබා දිය හැකි ඉන්ධන ප්‍රමාණය මෙම මාර්ගෝපදේශ හා නිර්ණායක අනුව ප්‍රමාදයකින් තොරව නිකුත් කිරීමට කටයුතු කළ යුතු ය.

IX. ඉහත සඳහන් ආකාරයට ලබා ගන්නා ලද ඉන්ධන භාවිතයෙන් අදාළ බස් රථ නියමිත ගමන් වාර සංඛ්‍යාව ධාවනය කළ බවට තහවුරු කර ගැනීමෙන් පසුව පමණක් නැවතත් ඉන්ධන ලබා ගැනීමට යොමු කළ යුතු ය. ඒ සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් ජාතික ගමනාගමන  කොමිෂන් සභාව මගින් සකස් කර ඉදිරිපත් කළ යුතු ය.

X. අන්තර් පළාත් තුළ ධාවනය වන එක් එක් බස් රථ සඳහා  හඳුනා ගන්නා ලද  එක් ඩිපෝවක් පමණක් වෙන් කෙරෙන අතර එක් ගමන් වාරයක් සඳහා ඉන්ධන ටැංකියේ ධාරිතාවය ප්‍රමාණවත් නොවන අවස්ථාවන්හි දී (උදා:- යාපනය සිට කොළඹ) එවැනි බස් රථ සඳහා පමණක් ඉන්ධන පිරවුම්හල් දෙකක් උපරිම වශයෙන් නම් කළ යුතු ය.

XI. යම් ආකාරයකින් මෙ ආකාරයට ලබා ගන්නා ඉන්ධන අවභාවිතා කරන බවට පැමිණිල්ලක් හෝ තොරතුරක් ලද හොත් වහාම ඒ සම්බන්ධව පරීක්ෂා කර එය තහවුරු වන්නේ නම් අදාළ බස් රථයේ මාර්ග ධාවන බලපත්‍රය තාවකාලිකව අත්හිටුවීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාව කටයුතු කළ යුතු ය.

XII. මෙම වැඩපිළිවෙළ යටතේ ඉන්ධන ලබා ගන්නා සියලුම බස් රථ පරීක්ෂා කිරීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ හදිසි වැටලීම් අංශය, ප්‍රවාහන අමාත්‍යාංශයේ විගණන අංශය හෝ ප්‍රවාහන අමාත්‍යාංශය විසින් නම් කරන ලද නිලධාරීන් මඟින් කටයුතු කරන අතර ඒ සඳහා අදාළ තොරතුරු ලබා දීමට සියලුම පාර්ශවකරුවන් කටයුතු කළ යුතු ය.

**1.2** පළාත් තුළ ධාවනය වන බස් රථ සඳහා

I. පළාත්බද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරින් මඟින් මාර්ග බලපත්‍ර නිකුත් කර ඇති, අදාළ පළාත තුළින් ගමන් ආරම්භ කර එම පළාත තුළම පමණක් ධාවනය වන බස් රථ සඳහා එම පළාත තුළ පිහිටි නම් කරන ලද ශ්‍රී ලංගම ඉන්ධන පිරවුම්හල් මඟින් ඉන්ධන නිකුත් කිරීම කළ යුතු ය.

II. පළාත තුළ ධාවනය වන එක් එක් බස් රථ සඳහා හඳුනා ගන්නා ලද එක් ඩිපෝවක් පමණක් වෙන් කළ යුතු අතර එම ඉන්ධන පිරවුම්හලෙන් පමණක් ඉන්ධන නිකුත් කළ යුතු ය. ඒ අනුව, එක් එක් ඩිපෝව සඳහා යොමු කරනු ලබන බස් රථ වල අංකය හා ගමනාන්තය පිළිබඳ තොරතුරු ඇතුලත් ලේඛනයක් සෑම ඩිපෝ ඉන්ධන හලක් වෙතම ලබා දීමට පළාත්බද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය කටයුතු කළ යුතු ය.

III. මාකුඹුර හරහා අධිවේගී මාර්ගයේ බස්නාහිර පළාත තුළ ධාවනය කරනු ලබන බස් රථ සඳහා මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ පිහිටුවා ඇති ඉන්ධන පිරවුම්හලෙන්, දෛනිකව බස්නාහිර මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මඟින් නිර්දේශ කරනු ලබන ප්‍රමාණයන්ට යටත්ව අදාළ බස් රථ සඳහා ඉන්ධන නිකුත් කිරීමට කටයුතු කළ යුතුය.

IV. අදාළ ඩිපෝව මඟින් පළාත් බස් රථ සඳහා ඉන්ධන ලබා දීමේ දී පළාත්බද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මඟින් නිකුත් කළ ධාවන බලපත්‍රය හා ඉන්ධන කූපන් පත්‍රය (ආකෘතිය 01) ඉදිරිපත් කළ යුතු ය.

V. ඒ ඒ බස් රථය සඳහා එක් ගමන් වාරයකට වැය වන ඉන්ධන ප්‍රමාණය පළාත්බද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මඟින් තහවුරු කර ඉන්ධන කූපන් පත්‍රයෙහි සඳහන් කළ යුතු ය. ඒ අනුව, දිනකට ධාවනයට අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය ඉහත සම්බන්ධීකරණ නිලධාරියා හා ඩිපෝ කළමණාකරු මඟින් සියලුම මාර්ග ආවරණය වන පරිදි ප්‍රශස්ත ලෙස බෙදා දීමට කටයුතු කළ යුතු ය.

VI. පළාත්බද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මඟින් ඩිපෝව වෙත පූර්ණ කාලීනව අනුයුක්ත කර ඇති සම්බන්ධීකරණ නිලධාරියා හා ඩිපෝ කළමණාකරු විසින් පළාත් බස් රථ සඳහා ලබා දිය හැකි ඉන්ධන ප්‍රමාණය මෙම මාර්ගෝපදේශ හා නිර්ණායක අනුව ප්‍රමාදයකින් තොරව අදාළ බස් රථ ප්‍රමාණයට නිකුත් කිරීමට කටයුතු කළ යුතු ය.

VII. ඉහත සඳහන් ආකාරයට ලබා ගන්නා ලද ඉන්ධන භාවිතයෙන් බස් රථ නියමිත වාර සංඛ්‍යාව ධාවනය කළ බවට තහවුරු කර ගැනීමෙන් පසුව පමණක් නැවතත් ඉන්ධන ලබා ගැනීමට යොමු කළ යුතුය. ඒ සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් පළාත්බද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මඟින් සකස් කර ඉදිරිපත් කළ යුතු ය.

VIII. දෛනිකව නිකුත් කරනු ලබන ඉන්ධන පිළිබඳව වාර්තාවක් ඩිපෝ කළමනාකරුගේ හා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මගින් පත් කර ඇති සම්බන්ධීකරණ නිලධාරියාගේ අත්සනින් යුක්තව, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති, ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සභාපති, අදාළ පළාත්බද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිවල සභාපතිවරුන් වෙත අදාළ දිනට පසු දින දහවල් 12.00 ට පෙර Whatsapp මගින් යොමු කළ යුතුය.

IX. යම් හෙයකින් මෙසේ ලබා ගන්නා ඉන්ධන අවභාවිතා කරන බවට පැමිණිල්ලක් හෝ තොරතුරක් ලද හොත් වහාම ඒ සම්බන්ධව පරීක්ෂා කර එය තහවුරු වන්නේ නම් අදාළ බස් රථයේ මාර්ග ධාවන බලපත්‍රය තාවකාලිකව අත්හිටුවීමට පළාත්බද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය කටයුතු කළ යුතුය.

X. මෙම වැඩපිළිවෙළ යටතේ ඉන්ධන ලබා ගන්නා සියලුම බස් රථ පරීක්ෂා කිරීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ හදිසි වැටලීම් අංශය, පළාත්බද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියෙහි හදිසි වැටලීම් අංශය, ප්‍රවාහන අමාත්‍යාංශයේ විගණන අංශය හෝ නම් කරන ලද නිලධාරීන් මගින් කටයුතු කරන අතර ඒ සඳහා අදාළ තොරතුරු ලබා දීමට සියලුම පාර්ශවකරුවන් කටයුතු කළ යුතු ය.

**2)** කාර්යාල ප්‍රවාහන සේවා

I. කාර්යාල ප්‍රවාහන සේවා යටතේ ඉන්ධන ලබා ගැනීමේ දී පිළිගත් කාර්යාල ප්‍රවාහන සංගමයක ලියාපදිංචිය ලබා තිබීම අනිවාර්ය වේ.

II. එම ලියාපදිංචි වීම හඳුනා ගත හැකි ආකාරයේ ස්ටිකරයක් ලබා දීමට කටයුතු කරන අතර ඉන්ධන ලබා ගැනීමට පැමිණීමේ දී වාහනයේ ඉදිරිපස වීදුරුවේ පැහැදිලිව පෙනෙන ලෙස ප්‍රදර්ශනය කළ යුතුය.

III. මෙහි දක්වා ඇති ආකෘති පත්‍රයට අනුව සකස් කරන ලද නිර්දේශ ලිපියක් එම සංගම්වල ලේකම් හා සභාපති විසින් අත්සන් යොදා ඉදිරිපත් කළ යුතු අතර ඒ අනුව පමණක් ගමනේ ආරම්භක සහ අවසන් ස්ථාන සලකා බලා ඉන්ධන නිකුත් කිරීමේ ප්‍රමාණය තීරණය කිරීමට කටයුතු කළ යුතුය.

IV. මෙම නිර්දේශිත ලිපිය අත්සන් කරන ලේකම් හා සභාපතිවරයාගේ ආදර්ශ අත්සන් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

V. එම ඉන්ධන නිකුත් කිරීම පිණිස එක් එක් වාහනය සඳහා නියමිත ඩිපෝවක් වෙන් කරන අතර ඉන් පරිබාහිර කිසිදු ඩිපෝවකින් ඉන්ධන නිකුත් නොකළ යුතුය.

VI. සංගම්වල නිර්දේශ ලිපිය සත්‍ය වශයෙන්ම කාර්යාල සේවාවේ යෙදෙන වාහන සඳහා පමණක් නිකුත් කළ යුතු අතර එසේ නොවන අවස්ථා අනාවරණය වුවහොත් අදාළ සංගමයේ වාහන සඳහා ඉන්ධන ලබා දීම අත්හිටුවිය යුතුය.

**3)** පාසල් ප්‍රවාහන සේවා සඳහා ඉන්ධන ලබා දීම.

I. සිසු සැරිය බස් රථ සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ලියාපදිංචි සහතිකය මත එම ආයතනය මගින් නිර්දේශ කරනු ලබන ඉන්ධන ප්‍රමාණය ලබා දීමට කටයුතු කළ යුතු අතර, එක් එක් ඩිපෝවක් සඳහා යොමු කරනු ලබන සිසුසැරිය බස් රථ වල අංකය, ආරම්භක සහ අවසන් ධාවන ස්ථානය, එක් ගමන්වාරකට අදාළ කිලෝ මීටර්

ප්‍රමාණය සහ නිර්දේශිත ඉන්ධන ප්‍රමාණයද ඇතුළත් ලේඛනයක් ජාතික ගමනාගමන කොමිෂන් සභාව / පළාත් බද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මගින් අදාළ ඩිපෝව වෙත යොමුකළ යුතුය.

II. පාසල් ප්‍රවාහන සේවා යටතේ ඉන්ධන ලබා ගැනීමේ දී පිළිගත් පාසල් ප්‍රවාහන සංගමයක ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

III. එම ලියාපදිංචි විම හඳුනාගත හැකි ආකාරයේ ස්ටිකරයක් ලබා දීමට කටයුතු කරන අතර ඉන්ධන ලබා ගැනීමට පැමිණීමේ දී වාහනයේ ඉදිරිපස වීදුරුවේ පැහැදිලිව පෙනෙන ලෙස ප්‍රදර්ශනය කළ යුතුය.

IV. මෙහි දක්වා ඇති ආකෘති II පත්‍රයට අනුව සකස් කරන ලද නිර්දේශ ලිපියක් එම සංගම්වල ලේකම් හා සභාපති විසින් අත්සන් යොදා ඉදිරිපත් කළ යුතු අතර ඒ අනුව පමණක් ගමනේ ආරම්භක සහ අවසන් ස්ථාන සලකා බලා ඉන්ධන නිකුත් කිරීමේ ප්‍රමාණය තීරණය කිරීමට කටයුතු කරනු ඇත.

V. මෙම නිර්දේශිත ලිපිය අත්සන් කරන ලේකම් හා සභාපතිවරයාගේ ආදර්ශ අත්සන් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

VI. එම ඉන්ධන නිකුත් කිරීම පිණිස එක් එක් වාහනයක් සඳහා නියමිත ඩිපෝවක් වෙන් කරන අතර ඉන් පරිබාහිර කිසිදු ඩිපෝවකින් ඉන්ධන නොකළ යුතුය.

VII. සංගම්වල නිර්දේශ ලිපිය සත්‍ය වශයෙන්ම පාසල් ප්‍රවාහන සේවාවේ යෙදෙන වාහන සඳහා පමණක් නිකුත් කළ යුතු අතර එසේ නොවන අවස්ථා අනාවරණය වුවහොත් අදාළ සංගමයේ වාහන සඳහා ඉන්ධන ලබා දීම අත්හිටුවිය යුතුය.

**4) ගොයම් කැපීම ඇතුලු කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සඳහා / ඉන්ධන ජනන යන්ත්‍ර ආදී යන්ත්‍රෝපකරණ සඳහා ඉන්ධන නිකුත් කිරීම.**

I. ගොයම් කැපීම ඇතුලු සියලු කෘෂිකාර්මික කටයුතුවලට යොදා ගනු ලබන යන්ත්‍ර සූත්‍ර සඳහා ඉන්ධන අවශ්‍යතාවය සඳහන් ඉල්ලීම අදාළ පුද්ගලයා විසින් ගොවි සංවිධානය හරහා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරී / ග්‍රාම නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතුය. අනතුරුව එම නිලධාරීන් විසින් සහතික කරන ලද එම ඉල්ලීම ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිර්දේශය සහිතව ඩිපෝ කළමණාකරු වෙත ඉදිරිපත් කළ යුතුය. (අදාළ නිලධාරීන්ගේ අත්සන හා නිල මුද්‍රාව අනිවාර්යය වේ.)

II. ඉන්ධන නිකුත් කරන ප්‍රමාණය ප්‍රාදේශීය ලේකම් විසින් යන්ත්‍රයේ ධාරිතාවය සහ වැඩ ප්‍රමාණය සලකා බලා තීරණය කළ යුතුය.

III. යන්ත්‍ර සූත්‍ර සඳහා ඉන්ධන නිකුත් කිරීම සම්බන්ධව ඉල්ලුම්කරුගේ නම, ලිපිනය අදාළ වන්නේ නම් ගොවි සංවිධානය, යන්ත්‍ර වර්ගය, ඉන්ධන ඉල්ලුම් කරන ප්‍රමාණය සහ දිනය ඇතුලත් ලේඛනයක් පවත්වා ගත යුතු අතර එම ලේඛනය අවශ්‍ය අවස්ථාවන් හී දී ප්‍රවාහන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

IV. එක් ඉන්ධන ඉල්ලීමක් සඳහා එක් වරක් පමණක් ඉන්ධන නිකුත් කරන අතර අදාළ ලිපිය ඩිපෝව මගින් ගොණුකර තබාගත යුතුය.

V. මේ ආකාරයට ලබාගනු ලබන ඉන්ධන අවභාවිතා කරන බවට අනාවරණය වුවහොත් නැවත ඉන්ධන නිකුත් කිරීම අත්හිටුවිය යුතුය.

5) ආයෝජන කලාපයේ පිහිටි කර්මාන්ත ශාලා සඳහා ඉන්ධන නිකුත් කිරීම.

I. අයෝජන මණ්ඩල කලාප තුළ පිහිටුවා ඇති කර්මාන්ත ශාලා සඳහා ඉන්ධන නිකුත් කිරීමේ දී අදාළ ආයතනයේ ඉල්ලීම, කළමණාකරන මට්ටමේ නිලධාරියෙකුගේ සහතිකය සහිතව ආයෝජන මණ්ඩලයේ කළාප කළමනාකරුගේ ද නිර්දේශ සහිතව ආසන්නතවම පිහිටි ඩිපෝ කළමණාකරු වෙත ඉදිරිපත් කළ යුතුය.

II. එම ඉල්ලීම් ලිපිය තුළ ප්‍රවාහන කටයුතු සඳහා නම් වාහන අංකය, යොදවනු ලබන කාර්යය, ආරම්භක සහ අවසාන ස්ථාන, අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය සහ දිනය පැහැදිළිව සඳහන් කළ යුතුය. වෙනත් අවශ්‍යතාවයක් සඳහා නම් (උදා- විදුලි ජනක යන්ත්‍ර හෝ වෙනත් යන්ත්‍ර ක්‍රියා කිරීම ආදී) අවශ්‍ය කාරණය පැහැදිළිව සඳහන් කළ යුතු අතර එය අත්‍යාවශ්‍ය බවට ආයෝජන මණ්ඩලයේ කළාප කළමණාකරු නිර්දේශ ලබා දීමේ දී තහවුරු කර ගත යුතුය.

III. එක් ඉන්ධන ඉල්ලීමක් සඳහා එක් වරක් පමණක් ඉන්ධන නිකුත් කරන අතර අදාළ ලිපිය ඩිපෝව මගින් ගොණුගත කර තබාගත යුතුය.

IV. ආයෝජන මණ්ඩලයේ අදාළ කළාපයේ කළමණාකරු මගින් ඉන්ධන නිකුත් කිරීමට අදාළ තොරතුරු එක් එක් ආයතනයට අදාළව පවත්වාගෙන යා යුතු අතර මේ ආකාරයට ලබා ගන්නා ඉන්ධන අදාළ කාර්යය සඳහා පමණක් භාවිතා කරන බවට එකම කාර්යය සඳහා නැවත නැවතත් ඉන්ධන ලබා නොගන්නා බවට තහවුරු කර ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් සකස් කර ගත යුතුය.

V. යම් ඩිපෝවක පිහිටි ඉන්ධන පිරවුම්හලක් මගින් ඉන්ධන ලබා ගැනීමට ආයෝජන මණ්ඩලය මගින් අනුමත කළ කර්මාන්තශාලාවක් ඉල්ලුම් කළ පසු එම කර්මාන්තශාලාවේ ඉන්ධන අවශ්‍යතාවය පිළිබඳ හා / හෝ නෛතිකභාවය පිළිබඳ යම් තොරතුරක් ප්‍රවාහන අමාත්‍යාංශය විසින් ඉල්ලා සිටින විට දී එම තොරතුරු ලබා දීමට ආයෝජන මණ්ඩලයේ අදාළ කලාප කළමනාකරු කටයුතු කළ යුතු ය.

VI. මේ ආකාරයට නිකුත් කරනු ලබන ඉන්ධන අවභාවිතා කරන බවට අනාවරණය වුවහොත් අදාළ ආයතනය වෙත ඉන්ධන නිකුත් කිරීම අත්හිටුවීමට කටයුතු කළ යුතු ය.

6) ආයෝජන කලාපයෙන් බැහැරව පිහිටි කර්මාන්ත ශාලා සඳහා ඉන්ධන නිකුත් කිරීම.

I. අයෝජන මණ්ඩල කලාපයෙන් බැහැරව පිහිටුවා ඇති කර්මාන්ත ශාලා සඳහා ඉන්ධන නිකුත් කිරීමේ දී අදාළ ආයතනයේ ඉල්ලීම, කළමණාකරන මට්ටමේ නිලධාරියෙකුගේ සහතිකය සහ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහිතව ආසන්නතම ඩිපෝවෙහි කළමණාකරු වෙත ඉදිරිපත් කළ යුතු ය.

II. එම ඉල්ලීම් ලිපිය තුළ ප්‍රවාහන කටයුතු සඳහා නම් වාහන අංකය, යොදවනු ලබන කාර්යය, ආරම්භක සහ අවසාන ස්ථාන, අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය සහ දිනය පැහැදිළිව සඳහන් කළ යුතුය. වෙනත් අවශ්‍යතාවයක් සඳහා නම් (උදා - විදුලි ජනක යන්ත්‍ර හෝ වෙනත් යන්ත්‍ර ක්‍රියා කිරීම ආදී) අවශ්‍ය කාරණය පැහැදිළිව සඳහන් කළ යුතු අතර එය අත්‍යාවශ්‍ය බවට ප්‍රාදේශීය ලේකම් නිර්දේශ ලබා දීමේ දී තහවුරු කර ගත යුතුය.

III. එක් ඉන්ධන ඉල්ලීමක් සඳහා එක් වරක් පමණක් ඉන්ධන නිකුත් කරන අතර අදාළ ලිපිය ඩිපෝව මගින් ගොනු කර තබාගත යුතුය.

IV. ප්‍රාදේශීය ලේකම් මගින් ඉන්ධන නිකුත් කිරීමට අදාළ තොරතුරු එක් එක් ආයතනයට අදාළව පවත්වාගෙන යා යුතු අතර මේ ආකාරයට ලබා ගන්නා ඉන්ධන අදාළ කාර්යය සඳහා පමණක් භාවිතා කරන බවට සහ එකම කාර්යය සඳහා නැවත නැවතත් ඉන්ධන ලබා නොගන්නා බවට ද, තහවුරු කර ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් සකස් කර ගත යුතුය.

V. ප්‍රවාහන අමාත්‍යාංශය මගින් ඉල්ලා සිටින විටදී ඩිපෝ මගින් ඉන්ධන නිකුත් කිරීමට අදාළ තොරතුරු ලබා දීමට ප්‍රාදේශීය ලේකම් කටයුතු කළ යුතුය.

VI. මේ ආකාරයට ලබාගනු ලබන ඉන්ධන අවභාවිතා කරන බවට අනාවරණය වුවහොත් අදාළ ආයතනය වෙත ඉන්ධන නිකුත් කිරීම අත්හිටුවිය යුතුය.

**7) කුඩා පරිමාණයේ තේ කර්මාන්ත ශාලා සඳහා ඉන්ධන නිකුත් කිරීම.**

I. කුඩා පරිමාණයේ තේ කර්මාන්ත ශාලා සහ තේ දළු ප්‍රවාහනය කරන අය සඳහා ඉන්ධන නිකුත් කිරීමේ දී අදාළ ඉල්ලීම් ලිපිය කුඩා තේ වතු සංවර්ධන නිලධාරියා හෝ වෙනත් තේ වගාවට සම්බන්ධව ප්‍රාදේශීයව කටයුතු කරන රාජ්‍ය නිලධාරියෙකු ගේ සහතිකය ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහිතව ආසන්නතම ඩිපෝවට යොමු කළ යුතුය.

II. එම ඉල්ලීම් ලිපිය තුළ ප්‍රවාහන කටයුතු සඳහා නම් වාහන අංකය, යොදවනු ලබන කාර්යය, ආරම්භක සහ අවසාන ස්ථාන, සහ අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය සහ දිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. වෙනත් අවශ්‍යතාවයක් සඳහා නම් (උදා - විදුලි ජනක යන්ත්‍ර හෝ වෙනත් යන්ත්‍ර ක්‍රියා කිරීම ආදී) අවශ්‍ය කාරණය පැහැදිලිව සඳහන් කළ යුතු අතර එය අත්‍යාවශ්‍ය බවට ප්‍රාදේශීය ලේකම් නිර්දේශ ලබා දීමේ දී තහවුරු කර ගත යුතුය.

III. එක් ඉන්ධන ඉල්ලීමක් සඳහා එක් වරක් පමණක් ඉන්ධන නිකුත් කරන අතර අදාළ ලිපිය ඩිපෝව මගින් ගොනු කර තබාගත යුතුය.

IV. ප්‍රාදේශීය ලේකම් මගින් ඉන්ධන නිකුත් කිරීමට අදාළ තොරතුරු එක් එක් ආයතනයට/ පුද්ගලයාට අදාළව පවත්වාගෙන යා යුතු අතර මේ ආකාරයට ලබා ගන්නා ඉන්ධන අදාළ කාර්යය සඳහා පමණක් භාවිතා කරන බවට, එකම කාර්යය සඳහා නැවත නැවතත් ඉන්ධන ලබා නොගන්නා බවට තහවුරු කර ගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කර ගත යුතුය.

V. ප්‍රවාහන අමාත්‍යාංශය මගින් ඉල්ලා සිටින විටදී ඩිපෝ මගින් ඉන්ධන නිකුත් කිරීමට අදාළ තොරතුරු ලබා දීමට ප්‍රාදේශීය ලේකම් කටයුතු කළ යුතුය.

VI. මේ ආකාරයට ලබාගනු ලබන ඉන්ධන අවභාවිතා කරන බවට අනාවරණය වුවහොත් අදාළ ආයතනය / පුද්ගලයා වෙත ඉන්ධන නිකුත් කිරීම අත්හිටුවිය යුතුය.

8) නඩත්තු කටයුතු සඳහා ඉන්ධන නිකුත් කිරීම (අත්‍යවශ්‍ය මාර්ග නඩත්තු කටයුතු, විදුලිය, ජලය, දුරකතන ආදී සේවා)

I. දෛනික නඩත්තු කටයුතු පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය ආයතන වෙත (උදා - ජලය, විදුලිය, දුරකතන, කැළි කසල ප්‍රවාහනය ආදී ) ඉන්ධන ලබා ගැනීමේ දී ආයතන ප්‍රධානියා විසින් දිනකට අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය ප්‍රාදේශිය ලේකම්ගේ නිර්දේශ සහිතව ආසන්නතම ඩිපෝවෙහි කළමණාකරු වෙත යොමු කළ යුතුය.

II. එම ඉල්ලීම් ලිපිය තුළ ප්‍රවාහන කටයුතු සඳහා නම් වාහන අංකය, යොදවනු ලබන කාර්යය, සේවා සපයනු ලබන ප්‍රදේශය, අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය සහ දිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. වෙනත් අවශ්‍යතාවයක් සඳහා නම් අවශ්‍ය කාරණය පැහැදිළිව සඳහන් කළ යුතු අතර එය අත්‍යාවශ්‍ය බවට ප්‍රාදේශීය ලේකම් නිර්දේශ ලබා දීමේ දී තහවුරු කර ගත යුතුය.

III. ඉහත නිර්දේශිත ලිපිය හා ප්‍රවාහන අමාත්‍යාංශය/ ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලය මඟින් ලබා දී ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව ඉහත සේවා පවත්වාගෙන යාමට අවශ්‍ය ඉන්ධන නිකුත් කළ යුතුය.

IV. එක් ඉන්ධන ඉල්ලීමක් සඳහා එක් වරක් පමණක් ඉන්ධන නිකුත් කරන අතර අදාළ ලිපිය ඩිපෝව මඟින් ගොනු කර තබාගත යුතුය. එසේ වුව ද දීර්ඝ කාලීනව යම් ඉන්ධන ප්‍රමාණයක් ලබා දීමට අවශ්‍ය වන්නේ නම් උපරිම වශයෙන් දින 14ක් සඳහා ඉන්ධන ලබාදීම නිර්දේශ කිරීමට ප්‍රාදේශිය ලේකම් විසින් සිදුකළ යුතුය.

V. ඒ අනුව, අදාළ ප්‍රමාණය නිකුත් කළ පසු නිර්දේශිත ඉල්ලීම් ලිපිය ගොනු කර තබා ගැනීමට ඩිපෝ කළමණාකරු කටයුතු කළ යුතුය.

VI. ප්‍රාදේශීය ලේකම් මඟින් නඩත්තු සේවා සඳහා ඉන්ධන නිකුත් කිරීමට අදාළ තොරතුරු එක් එක් ආයතනයට අදාළව පවත්වාගෙන යා යුතු අතර මේ ආකාරයට ලබා ගන්නා ඉන්ධන අදාළ කාර්යය සඳහා පමණක් භාවිතා කරන බවට තහවුරු කර ගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් ප්‍රාදේශීය ලේකම්/ අදාළ ඉල්ලුම්කාර ආයතනයේ ප්‍රධානියා විසින් සකස් කර ගත යුතුය.

VII. ප්‍රවාහන අමාත්‍යාංශය මඟින් ඉල්ලා සිටින විටදී ඩිපෝ මඟින් ඉන්ධන නිකුත් කිරීමට අදාළ තොරතුරු ලබා දීමට ප්‍රාදේශීය ලේකම්/ අදාළ ඉල්ලුම්කාර ආයතනයේ ප්‍රධානියා කටයුතු කළ යුතුය.

VIII. මේ ආකාරයට ලබාගනු ලබන ඉන්ධන අවභාවිතා කරන බවට අනාවරණය වුවහොත් අදාළ ආයතනය වෙත ඉන්ධන නිකුත් කිරීම අත්හිටුවිය යුතුය.

9) ආහාර ද්‍රව්‍ය / භාණ්ඩ/ ගිලන් රථ/ සෞඛ්‍ය සේවා/ අවමංගල්‍ය රථ ආදී වෙනත් අත්‍යාවශ්‍ය සේවා සඳහා ඉන්ධන නිකුත් කිරීම

I. ගිලන් රථ සඳහා ඉන්ධන නිකුත් කිරීමට ප්‍රමුඛතාවය ලබා දිය යුතු අතර රියදුරුගේ ඉල්ලීම පරිදි අවශ්‍ය ඉන්ධණ ප්‍රමාණය ලබා දිය යුතු අතර ඒ සඳහා වෙනම ලේඛනයක් ඩිපෝ කළමනාකර විසින් පවත්වාගෙන යා යුතුය.

II. විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද 1/2022 චක්‍රලේඛයෙහි සඳහන් පරිදි වෙනත් අත්‍යාවශ්‍ය යැයි සැලකෙන එහෙත් අනෙකුත් ඉන්ධන පිරිවුම්හල් මගින් QR කේතය යටතේ ලියාපදිංචි වී ඉන්ධන සපයා ගැනීම ගැටලුවක් බව හඳුනාගත් අවස්ථාවන් හී දී දිස්ත්‍රික් ලේකම්වරයාගේ මහ පෙන්වීම යටතේ ඉන්ධන ලබා දෙන ලෙස ඉල්ලීමක් ප්‍රාදේශීය ලේකම් මගින් ඩිපෝ කළමණාකරු වෙත යොමු කළ යුතුය.

III. එම නිර්දේශිත ලිපිය තුළ ප්‍රවාහන කටයුතු සඳහා නම් වාහන අංකය, යොදවනු ලබන කාර්යය, ආරම්භක සහ අවසාන ස්ථාන, අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය සහ දිනය පැහැදිළිව සඳහන් කළ යුතුය. වෙනත් අවශ්‍යතාවයක් සඳහා අවශ්‍ය කාරණය පැහැදිළිව සඳහන් කළ යුතු අතර එය අත්‍යාවශ්‍ය බවට ප්‍රාදේශීය ලේකම් නිර්දේශ ලබා දීමේ දී තහවුරු කර ගත යුතුය.

IV. ඉහත නිර්දේශිත ලිපිය හා ප්‍රවාහන අමාත්‍යාංශය/ ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලය මගින් ලබා දී ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යාමට අවශ්‍ය ඉන්ධන නිකුත් කළ යුතුය.

V. ඒ අනුව, අදාළ ඉන්ධන ප්‍රමාණය නිකුත් කළ පසු නිර්දේශිත ඉල්ලීම් ලිපිය ගොනු කර තබා ගැනීමට ඩිපෝ කළමණාකරු කටයුතු කළ යුතුය.

VI. ප්‍රාදේශීය ලේකම් මගින් මෙම සේවා සඳහා ඉන්ධන නිකුත් කිරීමට අදාළ තොරතුරු ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර මේ ආකාරයට ලබා ගන්නා ඉන්ධන අදාළ කාර්යය සඳහා පමණක් භාවිතා කරන බවට තහවුරු කර ගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් ප්‍රාදේශීය ලේකම්/ අදාළ ඉල්ලුම්කාර ආයතනයේ ප්‍රධානියා විසින් සකස් කර ගත යුතුය.

VII. ප්‍රවාහන අමාත්‍යාංශය මගින් ඉල්ලා සිටින විටදී ඩිපෝ මගින් ඉන්ධන නිකුත් කිරීමට අදාළ තොරතුරු ලබා දීමට ප්‍රාදේශීය ලේකම්/ අදාළ ඉල්ලුම්කාර ආයතනයේ ප්‍රධානියා කටයුතු කළ යුතුය.

VIII. මේ ආකාරයට ලබාගනු ලබන ඉන්ධන අවභාවිතා කරන බවට අනාවරණය වුවහොත් අදාළ ආයතනය/ පුද්ගලයා වෙත ඉන්ධන නිකුත් කිරීම අත්හිටුවිය යුතුය.

**10.** සංචාරක ක්ෂේත්‍ර හා සම්බන්ධ කටයුතු සඳහා ඉන්ධන නිකුත් කිරීම

I. සංචාරක ක්ෂේත්‍ර හා සම්බන්ධ කටයුතු සඳහා ඉන්ධන නිකුත් කිරීමේ දී අදාළ ඉල්ලීම් ලිපිය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හෝ වෙනත් පිළිගත් සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධව ප්‍රාදේශීයව කටයුතු කරන රාජ්‍ය නිලධාරියෙකුගේ සහතිකය ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහිතව ආසන්නතම ඩිපෝවට යොමු කළ යුතු ය.

II. එම ඉල්ලීම් ලිපිය තුළ ප්‍රවාහන කටයුතු සඳහා නම් වාහන අංකය, යොදවනු ලබන කාර්යය, ආරම්භක සහ අවසාන ස්ථාන, සහ අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය සහ දිනය පැහැදිළිව සඳහන් කළ යුතුය. වෙනත් අවශ්‍යතාවයක් සඳහා නම් (උදා - විදුලි ජනක යන්ත්‍ර හෝ වෙනත් යන්ත්‍ර ක්‍රියා කිරීම ආදී) අවශ්‍ය කාරණය පැහැදිළිව සඳහන් කළ

යුතු අතර එය අත්‍යාවශ්‍ය බවට ප්‍රාදේශීය ලේකම් නිර්දේශ ලබා දීමේ දී තහවුරු කළ යුතුය.

III. විදේශීය සංචාරකයන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීමට අදාළව ඉන්ධන ලබාදීමේ දී එම සංචාරකයින් අපහසුතාවයට පත් නොවන ආකාරයට අවස්ථානුකූලව ඉන්ධන ලබාදීමට නොපමාව කටයුතු කළ යුතු ය.

IV. විදේශීය සංචාරකයන් සඳහා ප්‍රවාහන පහසුකම් සැලසීමේ බස් රථ සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් දැනටමත් නිකුත් කර ඇති ස්ටිකරය තවදුරටත් අදාළ බස් රථයේ ප්‍රදර්ශනය කිරීම සිදු කළ යුතු අතර, එක් ඩිපෝවකින් ඉන්ධන නිකුත් කළ පසු නිකුත් කළ ඉන්ධන ප්‍රමාණය සටහන් කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් ඉන්ධන ප්‍රමාණ සටහන් කිරීමේ කාඩ්පතක් නිකුත් කිරීමට. කටයුතු කළ යුතු ය.

V. ප්‍රාදේශීය ලේකම්/ ඉල්ලුම්කාර ආයතනය මගින් ඉන්ධන නිකුත් කිරීමට අදාළ තොරතුරු එක් එක් ආයතනයට/ පුද්ගලයාට අදාළව පවත්වාගෙන යා යුතු අතර මේ ආකාරයට ලබා ගන්නා ඉන්ධන අදාළ කාර්යය සඳහා පමණක් භාවිතා කරන බවටත්, අවභාවිතා නොවන බවටත් තහවුරු කර ගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කර ගත යුතු ය.

VI. ප්‍රවාහන අමාත්‍යාංශය මගින් ඉල්ලා සිටින විටදී ඩිපෝ මගින් ඉන්ධන නිකුත් කිරීමට අදාළ තොරතුරු ලබා දීමට ප්‍රාදේශීය ලේකම් කටයුතු කළ යුතු ය.

VII. මේ ආකාරයට ලබාගනු ලබන ඉන්ධන අවභාවිතා කරන බවට අනාවරණය වුවහොත් අදාළ ආයතනය / පුද්ගලයා වෙත ඉන්ධන නිකුත් කිරීම අත්හිටුවීමට කටයුතු කළ යුතු ය.

04.ඉහත සඳහන් කරුණු වලට අමතරව සෑම ඉන්ධන නිකුත් කිරීමකට අමතරව පහත සඳහන් පොදු කොන්දේසි වලට යටත්ව සේවා ලබා දීමට හා සේවා ලබා ගැනීමට සියලුම පාර්ශවකරුවන් කටයුතු කළ යුතුය.

<u>පොදු කොන්දේසි</u>

I. සියලුම වාහන කාණ්ඩවලට අදාළව ඉන්ධන නිකුත් කිරීම මෙහි සඳහන් මාර්ගෝපදේශවලට යටත් ව සිදු කළ යුතුය.
II. සෑම ඉන්ධන නිකුත් කිරීමක් සඳහා ම වාහන අංකය, දිනය, නිකුත් කළ ඉන්ධන ප්‍රමාණය, ගෙවූ මුදල ඇතුලත් ලදු පතක් සෑම ආයතනයක් / පුද්ගලයෙක් වෙත ලබා දීමට කටයුතු කළ යුතුය.
III. එක් එක් ප්‍රාදේශීය ලේකම් වරයෙකු මගින් ඉන්ධන ලබා ගැනීම සඳහා යොමු කරනු ලබන සියලු ඉල්ලීම් අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි ඩිපෝව වෙත පමණක් යොමු කළ යුතුය.

IV. ඉල්ලුමට සරිලන සැපයුම ලබාදීමට නොහැකි අවස්ථාවක දී අදාළ දිස්ත්‍රික් ලේකම්වරයා හා අදාළ ශ්‍රී ලංගම ප්‍රධාන ප්‍රාදේශික කළමණාකරුගේ එකඟතාවය මත ඩිපෝවේ ඉන්ධන ධාරිතාවය සහ පවතින ඉල්ලුම සැලකිල්ලට ගෙන බෙදා හැරීමේ කටයුතු තීරණය කළ යුතුය.

V. ඉන් පරිබාහිරව කටයුතු කරන නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කරන අතර බාහිර පාර්ශවයන් සඳහා අවස්ථානුකූලව ක්‍රියාමාර්ග ගත යුතුය.

VI. ඉන්ධන ලබා ගැනීම සඳහා පැමිණෙන බාහිර පාර්ශවයන් වෙත පරිශ්‍රය තුළ රැඳී සිටින කාලය තුළ දී ආචාරශීලීව සේවය සැලසීමට සියලු නිලධාරීන්/සේවකයන් වග බලා ගත යුතු ය.

VII. ඉන්ධන නිකුත් කරන පිරිවුම්හල වෙත අදාළ වාහනයේ රියදුරු පමණක් වාහනය සමඟ ඇතුල් විය යුතු ය.

VIII. ශ්‍රී ලංගම ඩිපෝ පරිශ්‍රයන් තුළට බාහිර පාර්ශවයන්ට අයත් වාහන ඇතුල් කිරීමේ දී හා පිට කිරීමේ දී ශ්‍රී ලංගම වත්කම් වලට අලාභයක් හෝ හානියක් නොවන පරිදි විධිමත් ආරක්ෂාවක් සලසා ගනිමින් ඉන්ධන නිකුත් කිරීම කළ යුතු ය.

IX. ඉන්ධන බෙදාහැරීම සඳහා වන කටයුතු නියාමනය කිරීමේ ක්‍රමවේද හා අධීක්ෂණය කිරීමේ ක්‍රමවේද ශ්‍රී ලංගම පාලනාධිකාරිය මඟින් සකස් කොට ප්‍රාදේශික කළමනාකරුවන්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කළ යුතු ය.

X. දෛනිකව එක් එක් ඩිපෝව සඳහා ලැබෙන ඉන්ධන තොග පිළිබඳවත් ඉන්ධන නිකුත් කිරීම පිළිබඳවත් වාර්තා තබාගත යුතු අතර, මේ සමඟ අමුණා ඇති ආකෘති අංක 03 ට අනුව පෙරදින ඉන්ධන ලැබීම හා බෙදාහැරීම පිළිබඳ කටයුතුවල සංක්ෂිප්ත වාර්තාවක් පසුදින අමාත්‍යාංශය මඟින් පත් කළ කමිටුවේ අධීක්ෂණය සඳහා අදාළ Whattsapp සමූහය වෙත යොමු කළ යුතුය. එහි වගකීම ප්‍රාදේශීය කළමනාකරුවන් විසින් දැරිය යුතුය.

05.මෙම උපදෙස් රාජ්‍ය මුදල් කළමනාකරණය සඳහා වූ රජයේ මුදල් රෙගුලාසි හා භාණ්ඩාගාර චක්‍රලේඛවලට යටත්ව නිකුත් කරනු ලබන බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

06.මෙම උපදෙස්වලට අනුකූලව කටයුතු කිරීමට සියලුම ඩිපෝ අධිකාරිවරුන් හා ප්‍රාදේශීය කළමනාකරුවන් කටයුතු කළ යුතු අතර, රජය මඟින් මෙරට පුරවැසියන්ගේ ජීවන තත්ත්වයන් නගා සිටුවීම සඳහා ප්‍රවාහනය බාධාවක් නොවීමට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට පවරා ඇති වගකීම ප්‍රශස්ථ ලෙස ඉටුකිරීමට ඉන් හැකිවනු ඇත.

07.මෙම චක්‍රලේඛය රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ හා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ එකඟතාවය මත නිකුත් කරමි.

08.මෙම චක්‍රලේඛය පිළිබඳ යම් කරුණු පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් ඊ.එස්.ජී. එදිරිසිංහ, අතිරේක ලේකම් (සංවර්ධන), (දුරකතන අංක - 0112689373) අමතා ලබා ගත හැකිවන බව වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි.

ආර්.ඩබ්.ආර්. පේමසිරි
ලේකම්

පිටපත් -

01. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
02. ලේකම්,විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
03. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය
04. සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරු
05. සියළුම දිසාපතිවරු
06.සියලුම ප්‍රාදේශීය ලේකම්වරු
07. සභාපති, ඛණිජ තෙල් නීතිගත සංස්ථාව
08. සභාපති, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

} කරු.අ.ක.ස / කරු.දැ.ගැ.ස

09.සභාපති, ජාතික ගමනාගමන කොමිෂන් සභාව
10. සභාපති, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
11.සභාපති, සියලුම පළාත්බද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරීන්
12.සියලුම ප්‍රධාන ප්‍රාදේශීක කළමනාකරුවන්, ශ්‍රී ලංගම
13. සියලුම ඩිපෝ කළමනාකරුවන්, ශ්‍රී ලංගම

} අදාළ නිලධාරීන් දැනුවත් කිරීම හා මේ අනුව කටයුතු කිරීමට

ආකෘතිය 01

I කොටස

අනුක්‍රමික අංකය -

ජාතික ගමනාගමන කොමිෂන් සභාව/ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය (.........................පළාත)

ඉන්ධන කූපනය

| | |
|---|---|
| බස් රථ අංකය | |
| මාර්ග අංකය හා සේවාව | |
| එක් දිශාවකට දුර | |
| දෛනික ධාවන ගමන් වාර සංඛ්‍යාව (දෙපසට) | |
| වෛනික ඉන්ධන අවශ්‍යතාවය | |
| මාර්ග බලපත්‍ර වලංගු කාල සීමාව | |
| ලොග්පත්‍ර ලබාගත් මාසය | |
| අවසන් ධාවන දිනය | |
| මයිලෝ මීටරය | |

ඩිපෝ කළමනාකාරතුමා,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,

...................... ඩිපෝව

...................... ඩිපෝව

ඉහත අංක දරන බස් රථය සඳහා දිනකට පසුපිටේ ii කොටසේ සඳහන් ඩීසල් ලීටර් ප්‍රමාණය අත්පිට මුදලට සැපයීම නිර්දේශ කරමි.

අත්සන සහ මුද්‍රාව

ප්‍රා/කළමනාකරු

.......................................

මා/ම.ප්‍ර.අධිකාරිය (බ.ප)

දිනය

ආකෘතිය 02

කළමනාකරු

................. ඩිපෝව

වාහන අංක ............... කාර්යාල සේවාවට ඉන්ධන ලබාගැනීම.

අපගේ සංගමයේ උක්ත අංක දරන බස්/වෑන් රථය අප සංගමයේ ලියාපදිංචි අංක .................... යටතේ ............... සිට (ආරම්භක නගරය) ...................... දක්වා කාර්යාල ප්‍රවාහන සේවා සැපයීමට ලියාපදිංචි වී ඇති ............................ ලිපිනයේ පදිංචි .................................... (නම සඳහන් කරන්න) සාමාජිකයා අප සංගමයේ ලියාපදිංචි වී ඇති බවත් බව මෙයින් සහතික කරන අතර ඔබ ඩිපෝ මගින් ඉන්ධන ලබා දීමට නිර්දේශ කරමු.

| | |
|---|---|
| .................................. | .............................. |
| සභාපති | ලේකම් |
| නිල මුද්‍රාව :- | නිල මුද්‍රාව :- |

ආකෘතිය 03

<u>දෛනික වාර්තාව යොමු කළ යුතු ආකෘතිය</u>

| අනු අංකය | දිනය | ඇණවුම් කළ ඉන්ධන ප්‍රමාණය | ලැබුණු ඉන්ධන ප්‍රමාණය | නිකුත් කළ ඉන්ධන ප්‍රමාණය | | | දිනට ඉතිරි ඉන්ධන ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|
| | | | | ශ්‍රී ලංගම බස් රථ | පෞද්ගලික බස් රථ | වෙනත් අත්‍යවශ්‍ය සේවා වාහන | |
| 01 | | | | | | | |
| 02 | | | | | | | |
| 03 | | | | | | | |

ආකෘතිය 01

I කොටස අනුක්‍රමික අංකය -

ජාතික ගමනාගමන කොමිෂන් සභාව/ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය (........................පළාත)

ඉන්ධන කූපනය

| | |
|---|---|
| බස් රථ අංකය | |
| මාර්ග අංකය හා සේවාව | |
| එක් දිශාවකට දුර | |
| දෛනික ධාවන ගමන් වාර සංඛ්‍යාව (දෙපසට) | |
| වෛනික ඉන්ධන අවශ්‍යතාවය | |
| මාර්ග බලපත්‍ර වලංගු කාල සීමාව | |
| ලොග්පත්‍ර ලබාගත් මාසය | |
| අවසන් ධාවන දිනය | |
| මයිලෝ මීටරය | |

ඩිපෝ කළමනාකාරතුමා,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,

..................... ඩිපෝව

..................... ඩිපෝව

ඉහත අංක දරන බස් රථය සඳහා දිනකට පසුපිටේ ii කොටසේ සඳහන් ඩීසල් ලීටර් ප්‍රමාණය අත්පිට මුදලට සැපයීම නිර්දේශ කරමි.

අත්සන සහ මුද්‍රාව

ප්‍රා/කළමනාකරු

.......................................

මා/ම.ප්‍ර.අධිකාරිය (බ.ප) දිනය

ආකෘතිය 02

කළමනාකරු

................. ඩිපෝව

වාහන අංක ............... කාර්යාල සේවාවට ඉන්ධන ලබාගැනීම.

අපගේ සංගමයේ උක්ත අංක දරන බස්/වෑන් රථය අප සංගමයේ ලියාපදිංචි අංක .................... යටතේ ............... සිට (ආරම්භක නගරය) ...................... දක්වා කාර්යාල ප්‍රවාහන සේවා සැපයීමට ලියාපදිංචි වී ඇති ............................ ලිපිනයේ පදිංචි .................................... (නම සඳහන් කරන්න) සාමාජිකයා අප සංගමයේ ලියාපදිංචි වී ඇති බවත් බව මෙයින් සහතික කරන අතර ඔබ ඩිපෝ මඟින් ඉන්ධන ලබා දීමට නිර්දේශ කරමු.

.................................. ...............................

සභාපති ලේකම්

නිල මුද්‍රාව :- නිල මුද්‍රාව :-

ආකෘතිය 03

<u>දෛනික වාර්තාව යොමු කළ යුතු ආකෘතිය</u>

| අනු අංකය | දිනය | ඇණවුම් කළ ඉන්ධන ප්‍රමාණය | ලැබුණු ඉන්ධන ප්‍රමාණය | නිකුත් කළ ඉන්ධන ප්‍රමාණය | | | දිනට ඉතිරි ඉන්ධන ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|
| | | | | ශ්‍රී ලංගම බස් රථ | පෞද්ගලික බස් රථ | වෙනත් අත්‍යවශ්‍ය සේවා වාහන | |
| 01 | | | | | | | |
| 02 | | | | | | | |
| 03 | | | | | | | |